




Welcome to LAKRUHUNU BUDDHIST Sri lanka Official Site

ශ්‍රී. බු. ව. 2554 වප් මස කලාපය, රා. ව. 2010 ක් වූ ඔක්තෝම්බර් 22 වන දින

**වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

***වී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.***

*නමො තසස භගවතො අර්හතො සමමා සමබුදධසස !!!*

## *මහා සංඝරත්නය සහ කඨින මාසය*

**ධර්මකාමී පින්වතුනි,**

**අද වප් පුරපසළොස්වක පොහෝ දිනයයි. බුදුරජාණන් වහන්සේ තව්තිසා දෙව්ලොව වස්තුන්මාසය ගතකොට මිහිතලයේ දඹදිව සංකස්ස පුරයට වැඩම කිරීම, වස් තුන්මාසය ගතකළ භික්ෂූන්වහන්සේලා පෙරවස් මහාපවාරණය සිදු කිරීම, ආදී ශාසනික වූ වැදගත් කරුණු සිහිපත් කෙරෙන දිනයයි.**

**අදින් ආරම්භවන දින 30 බෞද්ධ ජනතාවට විශේෂ වූ දින 30 කි. ඊට හේතුව වන්නේ වස්තුන්මාසය ගතකළ භික්ෂූන්වහන්සේලාට කඨින චීවර පූජාකිරීමේ භාග්‍ය උදාවීමයි. මෙම චාරිත්‍රය ගිහි පැවිදි දෙපක්ෂයම සම්බන්ධවී සිදුකරන බලවත් මහා පිංකමකි. එමෙන්ම විනය කර්මයකි. එබැවින් සංඝයා වහන්සේ පිළිබඳ සම්පූර්ණයෙන් අපහසු වුවද තරමක සරළ අබබෝධයක් ඇති**

කිරීම මෙම ධර්ම පත්‍රිකාවෙන් බලාපොරොත්තු වන්නේ මෙම මාසය තුළදී එම අවබෝධය තියුණු කරගැනීම ඉමහත් ධර්ම ලාභයක් වනු ඇතැයි විශ්වාසයෙනි.

බුධ - ධමම - සංඝ යන රතනත්තය වන්දනා කිරීමට අප සියලු දෙනාම භාවිතා කරන ''ඉතිපිසො ...... '' යනාදී ගාථා පාඨ තුන විසිහතරක් ගුණයන්ගෙන් තුනුරුවන් හඳුන්වයි. එහි ශාසනාරක්‍ෂක පිරිස් හතරෙන් විශේෂ ප්‍රධාන පිරිසවන ආර්‍ය්‍ය ශ්‍රාවක සංඝරත්නය හැඳින්වීමට අප දැනුමේ තරමට ද දැක ඇති වෙනත් පෙළ පාළියක් මාතෘකා කිරීමට වඩා ''සුපටිපනෙනා භගවතො ........ '' යනාදී නව මහා ගුණ අඩංගු එම ගාථාව උචිත ලෙස සිතා පිහිට කර ගතිමි.

සංඝ යන වචනය සමුහවාචී ශබ්දයකි ඕනෑම ජන්තු සමූහයක් හැඳින්වීමට යොද ගත හැකිය. දේව සමූහය- දේව සංඝ, මනුෂ්‍ය සමූහය-මනු සංඝ, බ්‍රහ්ම සමූහය- බ්‍රහ්ම සංඝ, වශයෙන් ද ගණ නාමයෙන් දේව ගණ, බ්‍රහ්ම ගණ, මනුෂ්‍ය ගණ, වශයෙන් ද ගත හැකිය. එය එසේ වුවද ශාසනික වූ මෙම සංඝ වචනය බුඬ ශ්‍රාවක පිරිසම කියවේ. ඊට හේතුව වන්නේ මනා ලෙස කෙළෙස් නැසූ යන අර්ථයෙනි. එවිට ඉහත කී සමූහ අර්ථයෙන් ම නොව සංඝ නාමය ඒ ඒ මාර්ග ඥානයෙන් රාගාදී ක්ලේශයන් නැවත නූපදින පරිදි නැසීම් සංසිඳවීම් වශයෙන් ප්‍රහීන කරන ලද සහ කරමින් පවතින බැවින් රහතන් වහන්සේ ප්‍රධාන කොට ඇති මාර්ග ඵලලාභී සමූහය ''සංඝ'' යනුවෙන් හඳුන්වයි.

''යදිදං චතතාරි පුරිස යුගානි අටඨපුරිස පුගගලා එස භගවතො සාවකසංඝො...'' යනුවෙන් මාතෘකා පාඨයේ දැක්වෙනුයේ ඒ අදහසයි. ඉහතකී පරිදි සෝවාන් ආදී මාර්ගස්ථ ඵලස්ථ වශයෙන් යුගල 4කි අටදෙනෙකි. ගිහි පැවිදි - දේව - බ්‍රහ්ම හෝ කවුරු වුවද සෝවාන් ආදී මාර්ගයට පත්වී අනතුරුව ලබන චිතතක්‍ෂණයේම අකාලිකව සෝවාන් ආදී ඵලයන්ට පත්වන නිසා එසේ බෙදන ලදහ.

එසේම මේ ආර්ය පුද්ගලයන් අටදෙනා ''සේඛ'' ''අසේඛ'' වශයෙන් දෙකට බෙදීමක් ද වේ. එසේ වන්නේ සෝවාන් මාර්ගයෙන් පටන් අර්හත් මාර්ගගත පුද්ගලයා දක්වා වූ හත් දෙනා තවමත් හික්මෙන බැවින් ''සේඛ'' යයි ද, රහතන් වහන්සේ හික්මී අවසන් වූ නිසා කතකිච්ච භාවයට (කළ යුතු සියල්ල අවසන් නිසා) පත්වූ නිසා ''අසේඛ'' යනුවෙනි.

ඉහත කී පරිදි තුන්ලොව පුරා විහිදී වාසය කරන ආර්‍ය්‍ය පුද්ගල සමූහය සංඝ නම් වේ. රතන සූත්‍රයේ ද සඳහන් පරිදි ''යෙ පුගගලා අටඨ සතං පසතථා, චතතාරි එතානි යුගානි හොනති..'' එකසිය අටදෙනෙකුට වශයෙන් නැවත බෙදේ. එසේ වන්නේ සෝවාන් ඵලයට පත් වර්ගතුනට අයත් වූ තිදෙනා සතර ප්‍රතිපදාවට අනුව දොළොස් දෙනෙකි. කාම, රූප, අරූප භවත්‍රයෙහි වෙසෙන සකෘදාගාමී ඵලයට පත් තිදෙනා ද ඉහත කී සතර ප්‍රතිපදාවෙන් ගැනගත් කළ දොළොස් දෙනෙකි එවිට විසිහතර දෙනෙකි. පංච ශුද්ධාවාසයන්හි අනාගාමී - ඵලලාභී 24 දෙනෙකි. එවිට 48 කි. සුක්ඛවිපස්සක , සමථයානික වශයෙන්

රහතන් වහන්සේලා දෙදෙනෙකි. සාමාන්‍යයෙන් සෝවාන් ආදී මාර්ගස්ථ වශයෙන් සතර දෙනක් ද සමග 54 දෙනෙකි. එම පනස්හතර දෙනා ශ්‍රද්ධාධුර- ප්‍රඥාධුර වශයෙන් දෙගුණ වී එකසිය අටදෙනෙකි.

ඉතා දීර්ඝ කාලයක් නිවන් අරමුණු කරගත් යම් පුද්ගලයෙකුගේ යහපත් චරිතයේ ආනිශංසයෙන් ඒ පුද්ගලයාගේ සිතෙහි සම්මා දිට්ඨි ආදී වශයෙන් අංග අටෙන් යුතු චිත්තය එකවර පළමුවරට පහළ වීම සෝවාන් මාර්ගයට පැමිණීම හෙවත් දර්ශන සම්පන්න වීමයි. ඒ ලොව්තුරා මග සිත පහළ වන්නේ එතෙක් සසර ඒ සත්වයා හැසිරවීමට පිට පැනීමට ඉඩ නොදී බැඳ තිබුණු රැහැන් පට හෙවත් සංයෝජන දශකයේ (1) සක්කාය දිට්ඨි (2) විචිකිච්ඡා (3) සීලබ්බත පරාමාස යන භව බන්ධනත්‍රය නැවත ඒ සන්තානයේ කිසි විටෙක නූපදින ලෙසට සුන්නද්දහිත වීම සෝවාන් වීමයි.

අනතුරුව පහළවන මාර්ග චිත්තය දෙවෙනි වර පහළ වනුයේ (4) කාම රාග (5) පටිඝ නම් වූ භව බන්ධන සංයෝජන දෙක තුනී කරමින් සකෘදාගාමී බවට පත්වේ.

ඉන් අනතුරුව තුන්වෙනි වරට එම අරිඅටඟි මගසිත පහළ වීමෙන් අනාගාමී ගණයට වැටේ. එසේවන්නේ සකෘදාගාමී මගින් තුනි වූ භව බන්ධන දෙක සම්පූර්ණයෙන් සුන් කරවමින් ය.

අර්හත් මාර්ගය නම්වූ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයෙන් යුතු වූ සිත සතරවෙනි වරට පහළ වනුයේ (06) රූපරාග (7) අරූප රාග (8) මාන (9) උද්ධච්ච (10) අවිජ්ජා යන එම සත්වයා රූප අරූප ලෝකයන් හි හසුරුවන සංයෝජන පංචකය සම්පූර්ණයෙන් සින්නක්කරව ප්‍රහීන කරමින් ය.

මෙසේ අවස්ථා භේද සතරකින්, නම් සතරකින් ව්‍යවහාර කළ ද හතර වරම භාවිතා වන්නේඑකම ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගයම බව සිතෙහි තබා ගත යුතුයි.

ඉහත දැක්වූයේ ත්‍රිවිධ ලෝකයේම වාසය කරන සියලු ආර්‍ය්‍ය පුද්ගලයන් පිළිබඳ ඉතා ගැඹුරු වූ විස්තරය . සරළ ලෙසින් ය. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ශ්‍රී සද්ධර්ම දේශනාව ලෝක සත්වයාට දේශනා කළේ ''අපපමාද' නම් වූ පදයට අඩංගු කොටය. එම ධර්මය අදහන පිළිපදින සියලු දෙනා ''බෞද්ධ'' යන නාමයෙන් හඳුන්වනවා සේ ත්‍රිවිධ ලෝකයේ වෙසෙන සියලු ආර්‍ය්‍ය පුද්ගල සමූහය (ගිහි පැවිදි ස්ත්‍රී පුරුෂ දිව්‍ය බ්‍රහ්ම) ලෝකෝත්තර මාර්ගස්ථ ඵලස්ථ පුද්ගලයන් සැමදෙනා ''සංඝ'' නාමයෙන් හැඳින්වෙති. මෙහි දැක්වූ විස්තරය සවිස්තරව දැක්වීමට මෙහි අවකාශ නැත. එබැවින් ධර්මය අසා කියවා දැන ඉගෙන ගත යුතුය.

බුදුරජාණන් වහන්සේ ධරමාන සමයෙහි මුළු දඹදිව් තලයේ අනික් ජනපද නගර ග්‍රාමහැර සැවැත් නුවර පමණක් ගිහි මනුෂ්‍යයෝ අතර කෝටි පහක් පමණ ආර්‍ය්‍ය පුද්ගලයින් විසූ බව දැක්වේ. ඉන් ඇතැමෙක් සෝවාන් වූ ඇත්තන්

ය. ඇතැමෙක් සකෘදාගාමී වූ ඇත්තන්ය. ඇතැමෙක් අනාගාමීවූ ඇත්තන් ය. එසේ වූ භික්ෂු භික්‍ෂුනී ගිහි දේව බ්‍රහ්මයෝ ද මැදින් බිඳුනු රන් කඳක් වෙනසක් ඇති නොවී පෑහෙන්නා සේ කාම රූප, අරූප තුන්ලෝකයේ විසිරී වෙසෙන අප්‍රමාණ වූ ආර්‍ය පුද්ගල උතුමන් ආර්‍ය ශීල සහ දර්‍ශනයෙන් සමාන වූ බැවින් සංඝ නාමයෙන් සළකති. ඒ සියළු දෙනාම බුදුරජාණන් වහන්සේගේ ආර්‍ය ශ්‍රාවක සංඝරත්නය බැවින් සෙසු ලෝකයාගේ ගෞරව බහුමාන ලැබීමට ඉසිලීමට සුදුසුය.

මාතෘකාවශයෙන් පාදක කරගත් කාටත් පුරුදු ගාථාවේ ''එස භගවතෝ සාවක සංඝො... '' යනාදී වශයෙන් විශේෂයෙන් ප්‍රධාන වශයෙන් ආර්‍ය ශ්‍රාවක සැරියුත් මුගලන් මහා කස්සප ආනන්ද, නන්‍ද රාහුලාදී අපරිමිත භික්‍ෂුන් වහන්සේලාම දැක්වේ .

ඒ භික්‍ෂු සංඝයා වහන්සේගේ පරපුර අසම්භින්නය නොකැඩී පවතී. ආර්‍ය පෘථග්ජන වශයෙන් කොටස් දෙකකි. යමක් සංඝයාවහන්සේලා සතු කිරීමට ''භික්ඛු සංඝස්ස දේම'' යනුවෙන් ප්‍රකාශ කරන විට ඒ දෙකොටසම පොදුවේ ගැනෙති. පරමාර්ථ සංඝයා වහන්සේ සම්මුති සංඝයා වහන්සේ යනුවෙන් ද හැඳින්වෙති. භික්‍ෂුන් වහන්සේලා සමූහයක් හැඳින්වීමට භාවිතා කරන සමූහ නාමය එක භික්‍ෂුන් වහන්සේ නමක් සඳහාද ලෝකයා භාවිතා කරති. ''සංඝයා වහන්සේ නමක් වඩිති '' යනුවෙනි. මෙතෙක් ඒ සරළ විස්තරය ඉදිරිපත් කළේ සංඝරත්නය පිළිබඳ යම් පමණක අවබෝධයකට මග පාද ගැනීමටයි.

තථාගතයන් වහන්සේගේ ආර්‍ය ශ්‍රාවක සංඝයා වහන්සේලාගේ චරිත ලක්‍ෂණ ප්‍රධාන වශයෙන් හතරකි . එනම්.

01. ''සුපටිපන්න'' මේ ලක්‍ෂණයෙහි ගැබ්වී ඇත්තේ ආර්‍ය මාර්‍ග නම් වූ ශීල - සමාධි- ප්‍රඥා සංඛ්‍යාත ත්‍රිවිධ ශාසනප්‍රතිපදාවෙහි නිසිසේ යෙදීමය. එනම් ත්‍රිවිධ ශාසන ප්‍රතිපදාවයි. එහි හොඳහැටි ගමන් කිරීමයි.

02. ''උජුපටිපන්න'' ඉහත කී ප්‍රතිපදවේ යෙදීමේදී ඇති අවංක ස්වභාවයයි. ඇද පළුදු නැති කමයි. ලෝකයාට පෙන්නීමට ප්‍රදර්ශනයට නොවේ. හැබෑවටම පුරන බැවින් කුහන- ලපන- මායා- සාඨෙය්‍යාදී කුහක අදහසක් නැතිව සුදු හුදු අදහසින් ප්‍රතිපත්තියේ යෙදීමෙන් ආර්‍ය සඞඝයා වහන්සේගේ එම ප්‍රතිපත්තිය චන්‍ද්‍රමඩන්ඩලයටත් වඩා කාන්තය, ශාන්තිය , නිර්මලය.

03.'' ඤායපටිපන්න'' මෙයින් ඉහතකී ප්‍රතිපත්තියේ ඵලය කියවේ. කරන්නන් වාලේ දුන්වන්නන් වාලේ පුරන පිළිවෙතක් නොවන නිසා ඉලක්කයක් නැති පුහුකාරියක් ද නොවන නිසා අති භයානක සසරින් එතෙරවීමට ඇති එකම පිළිවෙත බැවින් නිවන ලැබෙන්නේමය. හැම බෞද්ධලෝකයාටද ආදර්ශ නායකත්වය නිසා මේ ලක්‍ෂණයෙන් යුතුය.

04. ''සාමීචි පටිපන්න'' ඉහත කී සම්‍යක් පැහැදිලි නොවරදින පිළිවෙතෙහි යෙදෙන නිසා සෙස්සෝ ඒ උතුමන් දැක හුනස්නෙන් නැගිටී. සම්භාවනා ආදී සාමීචි කර්ම පවත්වති.

ඉහත කී ගුණ සතර හෙළිවන අවස්ථාවකි. අනේපිඬු මහා සිටුගේ දියණි චූල සුභද්‍රාව තම මාමණ්ඩිය (කාල සිටුතුමා) නිගණ්ඨයන්ට කැඳවා දන් දුන් වේලේ රහතන් වහන්සේ පිළිබඳ හොඳ අවබෝධයක් ලේලියට තිබූ බැවින් තම ලේලියගෙන් මාමණ්ඩිය ඉගෙනගත් පාඩම.

මාතෘකාවට අනුව තව ලක්ෂණ පහක් ආර්‍ය මහා සංඝරත්නය සතුව ඇත. එනම්,

(01) ආහුනෙය්‍යය. මහා සංඝරත්නය ගුණ සාගරයකි. ලොව කිසිදු ආගම් නායකයෙකුගේ ශ්‍රාවක පිරිසක ලඟ නැති අනන්ත ලක්ෂණවලින් යුතු නිසා ලෝකයාගෙන් චීවර පිණ්ඩ පාතාදී ප්‍රත්‍ය ලැබීමට පිළිගැනීමට සුදුසුය.

02. ''පාහුණෙය්‍ය'' සර්‍වඥයන් වහන්සේ නමක් පහළ වූ පසු එම කාලයේ පමණක් එම සසුන පවතිනතාක් පමණක් ලෝකයේ පහළ වන මේ ආර්‍ය මහා සංඝයා වහන්සේ වෙනත් කාල වල දී දක්නට නොලැබේ. ඊට වැඩි පූජ්‍ය අමුත්තන් පිරිසක් තවත් නැති නිසා ඥාතිහිත මිත්‍රාදී අමුත්තන්ට දෙන ආගන්තුක බත වුවද දීමට සුදුසු නිසා ''පාහුණෙය්‍ය'' වෙති.

03. ''දක්ඛිණෙය්‍ය'' සුර නර සැප ලැබීමට කම්පල අදහා දෙන දන් දීමට පිළිගැනීමට ආර්‍ය සංඝයා වහන්සේ හැර වෙන සුදුසු පිරිසක් වෙන නැත.

04. ''අඤ්ජලීකරණීයෝ'' දොහොත් මුදුන් තබා වැඳිය යුතු අය දෙව් මිනිස් ඒ ඒ ආදී පුද්ගලයන් ට ඇත. ඒ අතර සකළ ලෝකයාගේ අභිවාදනයට ඉතා යෝග්‍ය වන්නේ ආර්‍ය සංඝයා වහන්සේම ය.

05.'' පුඤ්ඤක්ඛෙත්තංඅනුත්තරං'' ලෝකයාගේ අනුත්තර පිං කුඹුරයි. පුණ්‍ය බීජ වැපිරීමට සුදුසුම ස්ථානය නොවරදින ස්ථානය අර්‍ය සංඝයා වහන්සේමය ''ඛෙත්තූ පමා අරහන්තො''

ඉහතින් මෙතෙක් සාරංශ වශයෙන් දැක්වූයේ ආර්‍ය සංඝයා වහන්සේලාගේ ලක්ෂණය යි. එහෙත් වර්තමාන සම්මුති භික්ෂු සංඝයා වහන්සේ පිළිබඳව ද සුලු හෝ සටහනක් මෙහි නොතිබීම මාතෘකාවේ අදහස පරමාර්ථය ප්‍රකට නොවේ.

දැනට වැඩසිටින පෘථග්ජන ශීලවන්ත සම්මුති භික්ෂු සංඝයා වහන්සේලා ද ඉහත කී දක්ඛිණෙය්‍යාදී ගුණ විශේෂයන්ට යෝග්‍යමය. ඊට හේතුව වන්නේ මුල දී සඳහන් ආර්‍ය සංඝයා වහන්සේ බවට පත්වන්නේ ද එම ගමන් කරන පිළිවෙත් පුරණ උතුමන් නිසාම ය. ගිහි ජනතාවගේ පින් කෙත ය. ඊට වැඩි කෙනෙක් ලෝකයේ දැනට ද නැත ඇතැම් විට වෙන වෙනම ගත් කළ සුළු වශයෙන් වැරදි

ඇත එය පෘතග්ජන භාවයේ ලක්ෂණයකි. එවැනි ඇත්තෝ බුදුන් වහන්සේ ජීවමාන කළ ද සිටියහ. ඉහත කී ආය්‍යී ගුණ විශේෂයන්ට පත්වීමට පිළිපන් නිසා උන්වහන්සේලා ද ''සොතා පතති ඵල සචපිකිරියාය පටිපනෙනා'' කාගේත් පරමාර්ථය - ප්‍රතිපත්තිය එකමය එබැවින් සම්මුති සංඝයා වහන්සේ වුවද නියම ශ්‍රාවක ගණයට වැටෙති.

අදින් ආරම්භන්නේ කඨින මාසය යි. ඒ පිංකම හරියට කරගන්න නම් ගිහි ජනතාව විසින් ඉහක කී පරිදි සංඝයා වහන්සේගේ ගුණ දැන ඒ සඳහා මෙම ධර්‍ම පත්‍රිකාව යම් තරමකට හේතුපාදක කරගනු ඇතැයි සිතමි. වස්තුන් මාසයේ දී ගිහි පැවිදි දෙපාර්ශ්වයම හොඳ පසු බිමක් සකස් කරගත් නිසා කඨින පිංකම දෙපාර්ශවයටම උපන් මහත් වූ පුණ්‍ය ලාභයකි. ගිහි ජනතාව ඒ බව හොඳින් වටහා ගත යුතුය. පුහුදුන් ලෝකය නිසා භික්ෂුන් වහන්සේලාගෙන් ද පෞද්ගලිකව ඇතැම් වැරදි නොකෙරෙනවා නොවෙයි. ඒ සඳහා උන් වහන්සේලාට ධර්‍මවිනයක් පවතිනව. ඒ අනුව ඒ ඇත්තන් කටයුතු කරනු ඇත. ගිහියන්වන අපටද ධර්‍ම විනයක් ඇත. තම තමන් විසින් තේරුම්ගෙන තම නැණ පමණින් කටයුතු කිරීමයි.

ගැටලු ඇතිවීම මිනිස් කමේ ලක්ෂණය කි. ඒ සඳහා පිළියම් ධර්‍මයට විනයට අනුව ගිහි පැවිදි දෙපාර්ශවයටම ඇත ගිහියන් ඒ සඳහා නැණ නුවණ භාවිතා කිරීමෙන් විසඳා ගත යුතුය. එසේ නැතහොත් මහා නරකයන් හි දීර්‍ඝ කාලයක් දුක් විඳීමටත් සමහරවිට එහි විපාකය මෙලොවදීමද එහි අනිෂ්ඨ විපාක දරු මුණුබුරන්ට ද විඳීමට සිදුවන බව කොසොල්රජතුමාට බුදුහිමියන් වදාරා ඇත. ඊට හේතුව වශයෙන් ඉහත කී සංඝරත්නයේ අපිරිමිත ගුණ හේතුවම බව දැනගත යුතුය. එසේම නිසි පරිදි කටයුතු කිරීමෙන් අප්‍රමාණ කුසල් සිදුවේ. එබැවින් මෙම කඨින චීවර පූජා මාසය තුළදී එම පිංකම් මහත්ඵල වීමට පසුබිම ධර්මයට හා විනයට අනුව තම තමන් විසින් සකසා ගත යුත්තක් බව තේරුම් ගෙන කටයුතු කිරීමට අදිටන් කරගනිමු.